

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**

| 57 වන කාණ්ඩය | බු.ව. 2558 ඉල් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 නොවැම්බර් මස 06 වන ද | 07 වන කලබ |
|---|---|---|

# පුතු හට බාර යි උරුමය

මහ සෑ වැඳගෙන සුරාංගනාවන්
මගේ පුතුට ආසිරි ගෙන එනවා
තිසා වැවේ - පැරැකුම් සයුරේ දිය
පුතු ගෙ සිනා තොල් අග තවරනවා

වෙල්ලස්සේ පීදුණු රන් ගොයමේ
කරලින් පුතු ගේ යහන් සදනවා
රුහුණේ මී කිරි පැණි හා මුසු කොට
පුතු දිව’ගේ අම රසය තබනවා

තෙරුවන් අනුහස සමඟින් සුරැකුණු
ලක් පොළොවෙන් පුතු දිරිය ලබනවා
පුතු ගෙන් මතු සුරැකෙන උරුමය දැක
ලක් මවු සොම්නස් සිනා සලනවා

**- අනඳ**



# පත් පොත් කියැවීම

**පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ විසිනි**

මස් ලේ ආදියෙන් යුත් ශරීරයාගේ වැඩීමට හා පැවැත්මට ආහාර පානයන් මෙන් බුද්ධියගේ වැඩීමට හා නො පිරිහී පැවැත්මට පත් පොත් කියැවීම ඉතා ම උවමනා වේ. දිනක් පාසා ම කළැ යුතු වේ. ආහාර පානයන් පථ්‍යාපථ්‍ය භාවය විමසා, කල්යල් බලා, ගතයුතුවාක් මෙන්, පත් පොත් කියැවීමෙහි ද සුදුසු නුසුදුසුකම් විමසා සුදුසු පත් පොත් ම සුදුසු කල්හි සුදුසු සේ කියැවියැ යුතු ය. ආහාර පානයන් සෙමින් සෙමින් විකා රසාස්වාදනයෙන් නො වැළඳුව හොත් නො දිරැ වියැ හැකිවනු පමණක් නොවැ, ආහාර රස සංඛ්‍යාත ඕජෝගුණය ශරීර පෝෂණයෙහි නො පොහොසත් වන්නාක් මෙන්, කියවන දැයක් සෙමින් සෙමින් පරීක්‍ෂාවෙන් කියවමින් අර්ථරසාස්වාදය නො කළැ හොත් ධාරණ ශක්තිය වැඩීමෙක් වත් බුද්ධි පෝෂණයෙක් වත් නොවේ.

මෙහි ''පත්'' නමින් කියැවෙනුයේ ග්‍රන්ථ පරිච්ඡේද'දි වශයෙන් නො පිරිසිඳන ලද නානා විෂයක වූ

උපදේශාත්මක වූ ඛණ්ඩ වාක්‍යයි. පෙරැ නම්, ශිලාලිපි - කතිකාවත් - තුඩපත් - තියුපත් - නානාවිධ වාර්තා ආදිය එයින් ගැනේ. මෙකලැ නම් ප්‍රධාන වශයෙන් පුවත් පත් හා සඟරාවෝ එයින් ගතැ යුතු වෙති.

ඔවුහු ද, විනෝදාත්මක වූ විකට ස්වරූප වූවෝ ය. (කවට ස්වභාව ඇත්තෝ ය,) ශිල්ප ශාස්ත්‍රාදිය පිළිබඳ වූවෝ ය. තත් තත් කාලානුවර්ති ප්‍රවෘත්තීන් ගෙන් ආඪ්‍ය වූ ලෝක වාර්තා ස්වරූප වූ සාමාන්‍යයෝ දැයි තුන්වැදෑරුම් වෙති.

මේ තුන් කොටස ම ශිෂ්ටාචාර සම්පන්න වූ ද නිරවද්‍ය වූ ද භාෂාවෙන් ගැළැපුණු කල්හි ම උපදේශ ස්වරූප වූ වාක්‍යයන් ගෙන් යුතු කල්හි ම සාමාන්‍යයෙන් මහාජනයා විසින් කියැවියැ යුතු යැ.

එහෙත්, ඉතා බාල වියෙහි සිටි අකුරු උගන්නා ළමයින් හට පුවත්පත් සඟරා කියැවීම විතර්ක බහුලවීමටත්, ඔවුන්ගේ නියම පාඩම්වලට බාධා පැමිණීමටත් සමාධිය ස්මෘතිය - හෙවත් සිත් සතන් එකඟ කැරැගැනීම හා ධාරණ ශක්තිය දියුණු කිරීම හෝ මිහිකුරැවීම (මේරවීම) වැළැක්මටත් හේතුවන බව ඇතැම් උගත්තු සිතති. සාමාන්‍ය ප්‍රවෘත්ති පත්‍රයෙකැ ළමයින් විසින් නො දතැ යුතු ප්‍රවෘත්තීන් ද පළවන වාර බොහෝ ය. කුඩාවරුන් නපුරු ආරංචියක් අසා එබන්දක් තමනුත් කොට බලන්නට පෙළෙඹෙන බව ඇත්තේ ය. එබැවින් ඒ උගතුන් ගේ මතය ද නිහින් ම බැහැර කළැයුතු නොවේ. බොහෝ වත්මන් උගතුන්ගේ මතය නම් ළමාකල්හි සිට ම ලෝක වාර්තා දැනීමෙන් සාමාන්‍ය ඥානයෙන් ක්‍රමයෙන්

මුහුකුරා යායුතු බව ය. බාලයාගේ ආහාර පානයන් පථ්‍යාපථ්‍යතාවත් විමසා ප්‍රමාණවත් ලෙස මවුපියන් විසින් පිළියෙල කැර දියැ යුතු නම්, ඔවුන් විසින් කියැවියැ යුතු දේත් ගුරුන් වැඩිසිටියන් විසින් තෝරා දියැ යුතු යැ යනු වරදෙක් නොවේ.

''පොත්'' නමින් කියැවෙනුයේ නොයෙක් ශිල්ප ශාස්ත්‍ර ආගම ධර්ම ආදිය විෂය කොට, ග්‍රන්ථ පරිච්ඡෙද'දීන් පිරිසිඳැ, ගද්‍ය වශයෙන් හෝ පද්‍ය වශයෙන් හෝ තදුභය මිශ්‍ර චම්පු වශයෙන් හෝ උගතුන් විසින් පිළියෙල කරන ලද උපදේශ සමූහ ස්වරූප වූ බන්ධන ජාතය යි.

මේ පොතුදු ආධුනිකයනට තෝරා දිය යුතු ය. පොත් නමින් පෙනෙන ඇතැම් බන්ධනයෝ ආධුනිකයන් තබා, ප්‍රවීණයන් විසිනුදු , නො කියැවියැ යුතු වෙති. සමහර පොත් ව්‍යාකරණ ඡන්දෝලංකාරාදි ශාස්ත්‍රයනට නො ගැළැපෙනසේ යෙදූ අපභ්‍රංශ වාක්‍යයන් නිසා භාෂා දූෂණයෙන් දුෂ්ට වැ ද, ඇතැම් පොත් ප්‍රස්තුත ශාස්ත්‍ර විෂයයෙහි අදක්ෂයන් විසින් ලියන ලද බැවින් අශාස්ත්‍රීය වැ ද, ඇතැම් පොත් අර්ථලාඝවය හා ව්‍යංජන බාහුල්‍යය ද ඇතිවන සේ ඉතා දික් කොටැ ලිවීමෙන් කියවනුවන්ගේ වෙහෙසට හේතු වැ ද, ඇතැම් පොත් නොයෙක් ව්‍යාකූල වූ යෙදුම් වලින් කියවනුවන්ගේ බුද්ධිය විකුණ්ඨිත (මොට) වන පරිදි ද, ඇතැම් පොත් ආධුනිකයන් නොමඟ යවන නපුරු අදහස්වලින් ගහන වැ ද පවත්නා බව සත්‍යයෙකි.

අපට දක්නට ලැබෙන ඇතැම් පොත් ආධුනිකයන් විසින් කියවන්නට තබා, පොත්ගුලකට වැද්දූදෙන්නටත් නුසුදුසු ය. ආදහන මාත්‍රයට ම සුදුසු ය. නොහොබනා

පොතෙකින් ආධුනිකයාගේ බුද්ධිය වැනැසේ. ප්‍රවීණයාගේ කාලය ද වැනසේ. එබැවින් එය ගිනිලන්නට ම සුදුසු ය. මෙසේ හෙයින් ආධුනිකයනට ගුරුන් විසින් තෝරා දෙන ලද පොත් ම කියැවීම සුදුසු වේ. ළමයින්හට වෙදුන් විසින් තෝරා නියම කළ ආහාරයන් ම කැවීම සුදුසු මෙන් ඒ ඒ වයස්හි ඊට ඊට සරිලන ආහාරයන් නියම කටයුතුවාක් මෙන් ආධුනිකයන් ගේ බුද්ධියත් වයසත් මෝරන සැටියට කියැවිය යුතු පොත් පිළිවෙළ යෙදියැ යුතු වේ.

පොත් තෝරන්නට දන්නෝත් බොහෝ පත් පොත් කියවා පළපුරුදු පෞඪ බුද්ධි ඇති ගුරුහු ම ය. සාමාන්‍යයෙන් බොහෝ පැරැණි ශතවර්ෂ ගණන් ඉකුත් වූ පොත් ඉතා හොඳ පොත් ය, නොහොඳ නම් එතෙක් කල් අපවත් නොවී නො පැවැතෙන බැවිනි. තෝරා ගත් පොත් බොහෝ වාර ගණනක් කියැවීම තේරුමක් බේරුමක් නැති වැ නොයෙක් පොත් බොහෝ ගණනක් යම්තම් දිවැ දිවැ කියවීමට වඩා බොහෝ ප්‍රයෝජනවත් වේ.

නියම උගතකු විසින් ලියූ පොතෙකින් උගත මනා දේ බොහෝ ය. එක් අතෙකින් සන්දර්භය ද (රචනා විලාසය ද) එක් අතෙකින් ඒ ඒ තැනට සුදුසු පද යොදා තිබෙන පරිදි ද, තව අතෙකින් නොයෙක් තැනැ නොයෙක් අමුතු පද යෙදුණු සැටි ද, සාමාන්‍යයෙන් ප්‍රස්තුතාර්ථය බෙද බෙදා පැහැදිලි ලෙස විස්තර කැරුණු සැටි ද, ඇතැම් තැනැ අප්‍රස්තුත වූ ඉතිහාස කලාදි අන්‍ය ශාස්ත්‍රීය පදාර්ථයන් ද ප්‍රාසංගික වශයෙන් දැක්වුණු සැටිදැයි යන ආදී නොයෙක් දේ විමසමින් කියැවිය යුතු ය.

එහි දු, මෙයින් එකි එකී දයක් සඳහා එකි එකී වාරය බැගින් සුපරීක්ෂාවෙන් කියැවීමත්, කියවන කියවන පරිච්ඡේදයක් පාසා සිතා බැලීමත්, සිහිකටයුතු කරුණු ස්මරණ චිහ්න වශයෙන් අන් පොතෙකැ සටහන් කොටැ තැබීමත් ඉතා ප්‍රයෝජනවත් වේ.

කථාවස්තු ස්වරූප නොවූ ශාස්ත්‍රීය ග්‍රන්ථයෙක් නම් එකශ්‍රැති ධාරණයෙහි සමර්ථ වූ කුශාග්‍ර බුද්ධි ඇත්තවුන් විසින් වුවත් යටත් පිරිසයෙන් (අන්තිම අඩුම ගණනින්) පස්වරක් වත් සුපරීක්ෂාවෙන් කියැවිය යුතු ය.

මෙසේ ඉතා හොඳින් සෙමින් කියැවූ මුල් පොත ඊළඟ පොත කියැවීමේ දී විශේෂාවබෝධයට අතිශයෝපකාරී වේ. කියවාගෙන යන කලැ නො වැටහෙන තැනුදු සටහන් කොට ගුරුන් විතාළ යුතු ය. උගතුන් හමු වූ විට සාකච්ඡාවට භාජන කටයුතු ය.

පොත් කියවනුවන්හට විශේෂයෙන් වුව මනා දේවල් නම් ඃ ලඝුවෘත්තිය (චාම් පැවැත්ම) සිත කය දෙකින් ම පිරිසිදු බව නීරෝග භාවය, කාලයේ අගය සැලැකීම- සමාධිය හෙවත්- කාම කෝපාදියෙන් හෝ ශෝක භයාදියෙන් නො සැලෙන සිත් සතන් පිළිබඳ තැන්පත් බව- තද්'ධිමුක්තතාව- හෙවත් දිවා රෑ දෙක්හි ඒ පොත් කියැවීමෙහි ම බැඳුණු වෙන'තෙකැ නො බැඳුණු අදහස් ඇති බව- උගතුන් බහුශ්‍රැතයන් සමඟ සාකච්ඡා කිරීම හා ඔවුන් ගේ කථා අසන්නට ප්‍රිය වන බව කියවන තාක් පොත්හි එක පදයක්වත් නො විමසා අවබෝධ නොකොටැ නො ඉක්මවන පුරුද්ද- කියවූ වාර ගණනට වඩා වාර ගණනක් ඒ කියවූ දෑ සිහිකොටැ කොටැ

නැවත නැවතත් සිතා බැලීම, කියවන විටැ අනෙක් හැම චින්තාවන් විස්මෘත (මතක නැති) කොට දමා මුළු සිතින් පොතට යොමුවීම යන ආදීහු වෙති.

මෙසේ කියැවිය යුතු පොතු ද බොහෝ වූ රැසෙකි. එකි එකී ශාස්ත්‍රයක් විෂයකොටැ ප්‍රධාන ග්‍රන්ථයන් හා පරිවාර ග්‍රන්ථයෝ පඞ්ක්ති වශයෙන් ඇත්තාහ. ඒ හැම කියැවූ පමණට ඒ ඒ ශාස්ත්‍රයෙහි ප්‍රවීණතර භාවයට පැමිණේ. සියලු ශාස්ත්‍රයන්හි ප්‍රවීණ වන්නට එක ජීවිත කාලයක් නො පොහොනා බැවින් යථාභිමත වූ එක් ශාස්ත්‍රයෙක්හි විශේෂඥ වන්නටත් සකල ශාස්ත්‍ර විෂයයෙහි සාමාන්‍යඥ වන්නටත් පොහොනා පරිදි පත් පොත් කියවන්නට සිතට ගත යුතු ය. (මේ පිළිබඳ වැ ලිය යුතු දෑ නම් බොහෝ ය. ලිපිය දික්වන බැවින් සංක්ෂෙපප කරම්හ)

සාමාන්‍යයෙන් මෙකලැ සිංහල පිරිස කියැවීමෙන් ඉතාම හීන වූ කොටසෙකි. එබැවින් ම ගැඹුරු බුද්ධි ඇත්තාහු අප අතරැ දුලබ වෙති. මෙ රටැ ඉතා ම තුනීමතින් අලෙවි වන දේ නම් පත් පොත් ය. ඉතා ම සුළු වශයෙන් කැවෙන ලුණු හෝ සීනි සඳහා නො ගෙවන මුදලින් අඩක් වත් සිංහලයෝ පත් පොත් සඳහා නො ගෙවති, බයස්කෝප් නාටක (රේස්) තරග දිවුම් පැනුම් බැලුම් හා වෙනත් වටපිට බැලුම් සඳහා ගෙවන කාලයෙන් සොළොසින් කලාවක්වත් පත් පොත් බැලුම් සඳහා නො ගෙවති. ගෙවතත් බෙහෙවින් ම නො බැලියයුතු පතක් පොතක් සඳහා යි. ඉදින් අප රට උගත්තු කෙසේ ඇති වෙත් ද?



# මෙත් ගී

**බම්බලපිටිය සිරි වජිරාරාමයේ වැඩ විසූ**
**පූජ්‍ය මෙත්තෙය්‍ය හිමිපාණන් විසිනි**

අප බුදු පියාණන් - වහන්සෙ ගෙ සෙවණැල්ලත්
අපහට සුවයි සුසුවයි - අපට තෙරුවන් සරණයි

සුව දෙමු දුක් නොදෙමු - මහ වැර වඩමු ඉවසමු
කෙළෙහි ගුණ සලකමු අපි - නොතොර වෙමු සිහි නුවණින්

අප ගෙටත් ගමටත් - රටටත් මෙතුන් ලොවටත්
තුනුරුවන් මුත් පිහිටෙක් - නැත, අනේ ඇත්තෙම නැත

මවුපිය ගුරුවරුන් - ගිලනුන් ගුණවතුන් හා
උවටමු දුක දුටු වහා - දුරුකරමු මෙත් කුලුණින්

අප හිසට ගිනිගුළි - හෙළන්නට එන අයටත්
වේවා නිවන් සුවයම - දුකෙක් නම් නොම වේවා!

අංගොඩත් හැඳලත් - රාගමත් මුළු ලෙව්හිත්
හැම ලෙඩහු තුන් සරණින් - අදම වෙත්වා සුව පත්

සඳුන් වෙනෙන් එන සුළඟක් වැනි වෙම්වා
සමන් වෙනෙන් එන සුළඟක් වැනි වෙම්වා
සඳෙන් වැහෙන සොම් අමරැස් වැනි වෙම්වා
මෙතින් සතුන් හට අම්මා වැනි වෙම්වා



# කවිය අවිය කරගත් ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

**රත්මලාන මල්ලිකාරාම ධර්මරක්ෂිත ත්‍රිපිටක ධර්මායතනයේ ආචාර්ය පූජ්‍ය බුත්තල ඤාණාධාර හිමියන් විසිනි**

1815 ප්‍රංශයේ නැපෝලියන් පරදවූ බ්‍රිතාන්‍යය ආසියාවේ රටවල් ද යටත් කැරගෙන අධිරාජ්‍යක් ගොඩ නැංවීය. මෙතෙක් ස්වාධීන රාජ්‍යයක් වශයෙන් පැවැති ශ්‍රී ලංකාවේ උඩරට රාජධානියේ අවසානය සනිටුහන් කරමින් 1815 මාර්තු මස 02 වැනිදා බ්‍රිතාන්‍ය මහ රජ ශ්‍රී ලංකාවේ මහ රජු වශයෙන් පත් කර ගති. බ්‍රිතාන්‍ය රජය විසින් මුලින් ලබා දී තිබූ පොරොන්දු සියල්ල කඩ කිරීම නිසා මුලින් ම 1818 ඌව වෙල්ලස්සේ දී වීර කැප්පෙටිපොළ ගේ ප්‍රධානත්වයෙන් කැරල්ලක් ඇති විය. 1848 දී වීර පුරන් අප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා ආදීන් ගේ ප්‍රධානත්වයෙන් ද කැරල්ලක් ඇති විය. මෙලෙසින් 1948 පෙබරවාරි 04 වැනිදා නිල වශයෙන් ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන තෙක් වසර ගණනාවක් පුරා පරාධීනත්වයෙන් මිදෙනු වස් ශ්‍රී ලාංකිකයන් ගෙනගිය නිදහස් සටනට ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ දයකත්වය පිළිබඳ ඇගයීමක් කිරීම මෙම ලිපියේ අරමුණයි.

19 වැනි සියවසේ අග භාගයේ දී කොළඹ කවියේ ආරම්භය සනිටුහන් වන අතර ඒ මුල් කාලීනයෝ කොළඹ යුගයේ වැඩිහිටි කවීන් ලෙස හඳුන්වනු ලැබෙත්. මෙකල සුදු අධිරාජ්‍යයන්ට විරුද්ධව පෑන අවියක් ලෙසින් භාවිත කළවුන් අතර කවිය අවියක් ලෙස සළකමින් කටයුතු කළ හිමිනමකි එස්. මහින්ද හිමිපාණෝ.

මුන් වහන්සේ ගේ සම්පූර්ණ නම සිකිම් මහින්ද හිමි යනුවෙනි. සිකිම් දේශය වූ කලී මධ්‍යම ආසියාවේ කුඩාම රටයි. මහින්ද හිමියන් ගේ ගිහි කල නාමය එස්. කේ. තෂිනම්ගල් නම් වූ අතර සහෝදරයන් තිදෙනෙකුගෙන් යුත් පවුලේ තෙවැනි සහෝදරයාද සිකිම් පුණ්ණජී නමින් පැවිදි වී සිටියේ ය. ජර්මන් ජාතික ඤාණතිලෝක හිමියන් හා තම සොහොයුරු හිමියන් ද සමඟින් දෙළොස් වැනි වියේදී පමණ (ක්‍රි.ව. 1912/1914) ශ්‍රී ලංකාවට පැමිණ පොල්ගස්දූව ආරාමයේ නතර විය. පසුව දෙඩම්දූව ශෛලබිම්බාරාමයේ දී මහින්ද නමින් පැවිදි බව ලැබූ හෙතෙම තම කුටියට යාබද කුටියක විසූ අප්‍රකට කවියෙකු වූ දෙඩම්දූවේ ශ්‍රී ජිනරතන හිමියන් වෙතින් කවියට යොමු වූ බව සමහරෙක් සඳහන් කරති. 1930 දී පමණ කොළඹට පැමිණි උන්වහන්සේ ප්‍රාචීන භාෂා හදරමින් ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් ද සමත් වූහ. පසුව කොළඹ ආනන්ද විද්‍යාලයෙහි ගුරු පත්වීමක් ලබා සිංහල, පාලි, බුද්ධ ධර්මය ආදී විෂයන් ඉගැන්වූහ.

කොළඹ යුගයේ වැඩිහිටි පරපුරේ කවීන්ගේ වස්තු විෂය බවට බෙහෙවින් පත්වූයේ ජාතිකාභිමානය යි. අධිරාජ්‍ය විරෝධී අරගලයට දයක වීමේ යුගයේ අවශ්‍යතාව ශ්‍රී

ලාංකිකයන් අබිමුව විය. ඒ අතුරින් කැපී පෙනෙනුයේ අප කථානායකයාණෝ ම යැ. උන්වහන්සේ ශ්‍රී ලාංකිකයකු නොවුව ද මෙය තමන් ගේ රට යන හැඟීමෙන් යුතුව ක්‍රියා කළ උන්වහන්සේ නිදසිටි ජනතාව අවධි කරන්නේ මෙලෙස ය.

මොන කරුමය ද තව ඇහැරුණු බවක් නැහැ
පැන පැන බියව මුළු වැදුමෙන් පලක් නැහැ
දිනුවත් පැරදුමත් කෝකත් කමක් නැහැ
එනු ඉදිරියට නැතහොත් නිදහසක් නැහැ

ගද්‍ය පද්‍ය කෘති 40 ක් පමණ රචනා කළ උන් වහන්සේ ජාතික කාව්‍යය අතර ''නිදහසේ මන්ත්‍රය'' ''නිදහසේ දැහැන'', ''ලංකා මාතා'' ආදිය කැපී පෙනේ. නිදහසේ මන්ත්‍රය කවි පන්තිය අරඹන උන්වහන්සේ සිංහලයන් ගේ තිබෙන නිවට ගතිය හෙළා දකිමින් ආවේගයෙන් යුතුව මෙලෙසින් හඬ නගති.

කෙස් ගහ පවා වෙන රටවල මිනිසුන්නේ
උස් නිදහස පිණිස සටනට සැරසෙන්නේ
හිස් මොළ තිබෙද්දිත් මේ ගැන නොතකන්නේ
ඇස් ගෙඩි දෙකට හෙණ ගහලද සිහලුන්නේ

ජාතික තොටිල්ල නම් වූ පද්‍ය සංග්‍රහය ද උන්වහන්සේ විසින් කුඩා දරුවන් උදෙසා රචනා කරන ලද්දේ ය. අනාගතයේ රට භාර ගැනීමට සිටින කුඩා දරුවාට නිදහස්, නිවහල් දේශයක ස්වෛරීව, ස්වතන්ත්‍රව ජීවත් වීමට උපදෙස් දෙන මෙය, මවකගේ උකුල මත නැළවෙන දරුවෙකුට පැවසෙන දරු නැළවිල්ලකි.

ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

උස් තැන් දැක පැකිලෙන් නේ
මිටි තැන් දැක පුප්පන් නේ
නිවටුන් බව සිතමින් නේ
මගේ පුතා ලොකු වන් නේ

මෙම පද්‍ය සංග්‍රහය පුරාවට ම ප්‍රෞඪ ඉතිහාසයෙහි තොරතුරු ඉදිරිපත් කරමින් දරුවාගේ සිත තුළ දිරිය වඩවන අතර ඉවසීම මෙන් ම ගුණ නුවණ වර්ධනය කිරීම ද නිවට බව දුරුකොට උත්තම ගුණ වගා කර ගන්නා අන්දම ද සරලව දක්වති.

සිංහලයා තුළ තිබෙන එකිනෙකා ඇණ කොටා ගන්නා ස්වභාවය, එකෙක් නැඟී සිටිනවාට තිබෙන අකමැත්ත දුරුකොට සියලු දෙනාම එක මවකගේ දරුවන් ලෙසින් එක්සත්ව එක්සිත්ව නැඟී සිටියහොත් ඕනෑම බලවේග යක් බිඳලිය හැකි බව මෙලෙසින් දක්වයි.

මුළු වැර යොදා වැඩ කරතොත් ඇතුව හිත
පුළුවනි අපට බිඳුමට ලොකු අයගෙ මැත
කුළුගෙඩි පහර එක පිට දෙක හෙළන මත
පළු පළු නොවන ගොරහැඩි කළු ගලක් නැත

රට අභ්‍යන්තරයේ පවත්නා භේද භින්නතා හා පරගැති ස්වභාව වනාහි ශ්‍රී ලාංකිකයන් තුළින් තුරන් කරලීමට

නොහැකිය. ඒවා ඉතිහාසය පුරාවට ම හාරා අවුස්සා බැලුවහොත් සාක්ෂි එමට ය. එය අදටත් හෙටටත් එසේම ය. උන්වහන්සේ එද දුටු ශ්‍රී ලාංකිකයන් ගේ එවැනි දුර්ගති ලක්ෂණ කිහිපයක් දක්වා ඇත්තේ මෙපරිද්දෙනි.

අපේ රටට පිළිමල් වන සතුරු මුල
අපේ අයම වේ බිඳිනෙමු උන්ගෙ බල
අපේ මුතුන් මිත්තන් මළ සොහොන් වල
පිපේ එවිට ජාතික අභිමාන මල

උස්තැන් කපා ඇද මිටි තැන් පිර වීම
උස්මිටි දෙකම වඳකොට සම කර ලීම
උස් මනු දමක්! ගතියක්! යන පැව සීම
උස් හඬ නඟා පතුරව් හැම තැන දීම

ජාතික වැඩට මරගුල් අටවමින් සිට
නායක කමට දඟලන නිවටයන් හට
මේ ලක එකම අමු සොහොනක් කරන් නට
සාතික වෙන්න ! තරුණය ! අද පටන් කොට

ඉහත දැක්වූ පද්‍යාවලින් පෙනී යන්නේ මහින්ද හිමියන් තමන්ගෙන් මේ සිංහල රට වෙනුවෙන් කළ හැකි ඉහළම සේවය ඉටු කරලීමට කවිය අවියක් කරගෙන ඇති බවයි.



# මහ සෑයේ මිහිර ගලයි

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සූරිහු.

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
අපේ පොළොව සිහිල් වුණා
අපේ රටට සෙත ලැබුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
සුවඳැල් රත්හැල් වැවුණා
අපට අලුත් බත් ලැබුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
අපේ ඇහැට පින් පිරුණා
අපේ සිතට රස දැනුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
අපේ රටට සෙත ලැබුණා
අපේ සිතට සුව දැනුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
අපේ වැවේ දිය පිරුණා
නෙළුම් ඕලු මල් පිපුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
පින් දහමට සිත නැමුණා
සාදු කාර හඬ නැඟුණා

අනුරපුරේ රුවන් මැලී
මහ සෑයේ මිහිර ලැබී
ඇලේ දෙලේ දිය ඇදුණා
වෙලේ ගොයම් රැළි නැඟුණා



# සිංහල බෞද්ධයාගේ ගුණ හඳුනාගන්න

මුළු ලොව ම සොයා බැලුව ද ලක් වැසි බෞද්ධයා තරම් වාසනාවන්තයෙක් නැතැයි කීම ව්‍යාජ වර්ණනාවක් නොවේ.

හේ කරුණාවන්ත ය.

පරෝපකාරයේ නියැලියෙකි.

ශ්‍රද්ධාදි ගුණධර්මවලින් පිරි ජීවිතයක් ගත කරන්නෙකි.

බලන්න, මොහුගේ මුහුණ කොතරම් පියකරු ද?

සිනා මුහුණින් ඔවුනොවුන් බලා ප්‍රිය තෙපුල් බිණීම, දුටුවන්ගේ සිත් සිසිල් කරවයි.

අන් දුකෙහි දී සිත, ගිනි දුටු වෙඬරු පිඬක්සේ හුණුවෙයි.

තෙරුවන් විෂයෙහි පවත්නා මොහුගේ ගෞරවය හා විශ්වාසය කෙසේ වනම් ද?

ශ්‍රද්ධාව නිසාම විහාරස්ථාන කරා පැමිණීමට, මල් පහන් පිදීමාදී ආගමික කටයුතු කිරීමට ඉදිරිපත් වෙයි.

සීලය උසස් කොට සලකයි.

සිල්වතකු දැකීමට පවා ප්‍රිය කරයි.

එහෙයින් දුර බැහැර ගොස් සිල්වතුන් හමුවී උවටැන් කිරීමට යයි.

බණ කියවයි.

බණ අසයි.

බණ ඉගෙනගනියි.

බොහෝ වියදම් කොට දන් දෙයි.

දුගී මගී යාචකාදීන්ට සංග්‍රහ කරයි.

බොහෝ විට තමා බඩසයින් පෙළෙමින් අනිකෙකුගේ කුසගින්න නිවීමට සැරසෙයි.

මොහු කෙරෙහි ශ්‍රද්ධාව, ශීලය, ශ්‍රැතය, ත්‍යාගය, ප්‍රඥාව යන ගුණ බලපවත්වයි.

(ශ්‍රී සද්ධර්ම විනයාචාර්ය දරණාගම සුගතපාල මාහිමියන් වහන්සේ ලියූ. 'විපස්සනා ලිපි සරණියේ 'අපේ පරමාර්ථය' නම් ලිපියෙන් උපුටා හල්තොට දුශ්‍යන්ත රොසයිරෝ මහතා විසින් එවන ලදි)



# සුවඳ මල් වෙමු

**විශ්‍රාම ලත් ආචාර්යාණී ලක්ෂ්මී කරුණානායක මහාත්මනිය.**

නිවාඩු දිනයක අක්කත් නංගිත් තම ගෙවත්තේ ඇවිදිමින් ගස් වැල්වලට සාත්තු කළහ. මල් පාත්තියේ තණ කොළ ගලවමින් නංගී කල්පනාවකට වැටුණාය. මොනවද නංගි ඔයා කල්පනා කරන්නේ?

අක්කේ ! අපට අම්මල තාත්තලා ඉන්නවා මේ ගස්වලටත් අම්මල තාත්තලා ඉන්නවද?

නංගි, ඔයා ඉපදුණේ කොහෙන්ද? අම්මාගේ කුසයෙන් නේ ද?

ඒ වාගේ මේ ගස් හැදෙන්නේ කොහෙන්ද?

පොළවෙන්

එහෙනම් ගස් වැල්වල අම්මා මේ මහා පොළවයි.

එතකොට තාත්තා?

නංගිට ආරක්ෂාව සලසන්නේ අවශ්‍ය දේ ලබා දෙන්නේ තාත්තා නේ ද? ඒ වගේ තමයි මේ ගස්වලට

සුළඟ වැස්ස ඉර එළිය හඳ එළිය ලබා දෙන්නේ අහසයි. ඒ නිසා ගස් වැල්වල තාත්තා අහසයි.

එහෙනම් මේ ගස් වැල් හරියට අප වාගේමයි. නේ ද අක්කේ ?

ඔව්, නංගි ඒකනේ පුංචි ළමයි මල් වගේ කියන්නේ

ඒ කොහොමද?

මේ බලන්න නංගි සමන් පිච්ච වැලේ මල් හරි සුවඳයි.

රෝස, කපුරු, දස්, වතු සුදු ආදී මල් කොපමණ ලස්සනද? සුවඳද? ඒ මල් කවුරුත් ප්‍රිය කරනවා. මල් බුදු හාමුදුරුවන්ට පූජා කරන්න ගන්නවා. කොණ්ඩ සරසන්න ගන්නවා. මංගල අවමංගල සෑම අවස්ථාවකදී ම පිළිග ැනීමට ලක් වෙනවා.

අක්කේ ඒ අවස්ථාවලදී පිළිගන්නේ නැති මලුත් තියෙනවා?

ඔව් නංගි,අර බලන්න වැට අයිනේ කොන් වෙලා තියන නියඟලා මල !

අක්කේ ! ඒ මල හරි ලස්සනයි.

ඔව් නංගි, ඒ මල ලස්සනයි. සුවඳ නෑ. ඒ මලේ විස තැන්පත් වෙලා තියෙනවා. ඒ නිසා කිසිම කෙනෙක් කිසිම දෙයකට ඒ මල ගන්නේ නෑ. ඒ මල වස මලක් ඒ මලෙන් අනිත් අයට විපත් වෙන නිසා.

නංගිට පාසලේ දී හමුවෙලා ඇති නේ හොරකම් කරන සතුන් මරණ, වැරදි වැඩ කරන රණ්ඩු වෙන ළමයි ඒ

ළමයින්ට පංතියේ හෝ පාසලේ පිළිගැනීමක් තියෙනවද? නැහැ නේ ද?

නරක ළමයි ආශ්‍රය කරන්න ගියොත් හොඳ ළමයින් නරක් වෙනවා කියලා වැඩිහිටි අය කියනවා නේද? හරියට ඒ ළමයිනුත් අර නියඟලා මල වාගේ අනිත් අයට විපතක්මයි කරන්නේ. ඒ නිසා පිළිගැනීමක් නැහැ. එයාලාව කවුරුත් පිළිගන්නේ නැති නිසා එයාලගේ හිතේ කිසි සතුටක් නැහැ. නියඟලා මල වගේ රටට වැඩක් නැති විදිහට පරවෙලා යනවා.

සමන් පිච්ච මල කාගේත් පිළිගැනීමට ලක් වෙනවා විතරක් නොවෙයි. ඒ මල පර වුණාමත් වේළලා අරන් තියා ගන්නවා. ඒ සුවඳට ආස නිසා.

ගුණ නුවණ ඇති දරුවන් හරියට සමන් පිච්ච මල් වගේ මිය ගියත් නාමය කවුරුත් අගය කරනවා.

ඒ නිසා අපි කවුරුත් ගුණ නුවණ ඇති සුවඳැති මල් වෙමු.

දැන ඉගෙන ගත්තම  
තමයි කෙනෙකුගෙ වත්කම  
ගුණ නුවණ දැක්කම  
ඔහුට සලකති රටේ ඔක්කොම



# මහා සුදස්සන ජාතකය

**කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණී**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**

අප මහ බෝසතාණන් වහන්සේ ගේ පින්බර උත්පත්තිය සිදුවූයේත් සියලු කෙලෙසුන් නසා නිවන් මඟ අවබෝධ කැර ලොව්තුරා බුදු බව ලැබූයේත් වෙසක් පුන් පොහොය දිනයි. මේ උතුම් අවස්ථාවන්හි මුළු දඹදිව් තලය දෙව්ලොවක සිරි ගත්තේ ය. සල් උයන් සුපිපි මලින් පිරුණි. ගස් වැල් පළතුරින් පිරුණි. කුරුල්ලන්ගේ මෙන් ම බිඟුන්ගේ නාදය කන්කලු විය. දිව්‍ය සංගීත රාවය ද දිව සඳුන් සුවඳ ද මදාරා මල් සුවඳින් මුළු ලොවට සුගන්ධවත් විය.

එහෙත් අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී හතළිස් පස් වසරක් ඇවෑමෙන් එළඹි වෙසක් පුන් පොහොය දිනයේ සොබා දහම ද ශෝක විය. සල් ගස් අකලට පිපි මලින් පිරී ගියේ ය. කුරුලු ගායනා හා බිඟු නද නො ඇසුණි. මහ පොළොව කම්පා විය. කුකුත්ථා නදියෙන් දිය ස්නානය කළ බුදුරජාණන් වහන්සේ සඟපිරිවරින් කුසිනාරාපුර මල්ල රජුන් ගේ සල් උයනට වැඩි සේක. සල් සෙවණේ ගස් දෙකක් අතර

ඇඳක් පිළියෙල කර දෙන ලෙස ආනන්ද තෙරණුවනට උපදෙස් දුන් බුදුරජාණන් වහන්සේ එහි සිංහ සෙයාාවෙන් සැතපුණු සේක. එවිට දෙව් බඹ සේනාවෝ අහසේ සිට මල් සුවඳ පැන් ඉසිමින් පූජා පෙළහර කළහ. බුදු සමිඳුන් ගේ ශ්‍රී දේහය රන්වන් පැහැයෙන් බැබළුණි.

ආනන්ද තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගෙන් එක ඉල්ලීමක් කළහ. එනම් මේ කුඩා කුසිනාරා නුවර දී නොව බරණැස්, සැවැත් වැනි විශාල නගරයක දී පිරිනිවන් පානා සේක්වා'' යනුවෙනි. එවිට බුදුරජාණන් වහන්සේ 'කුසිනාරා කුඩා නගරයක් ලෙස නොසිතිය යුතු ය. ඈත අතීතයේ මහා සුදර්ශන සක්විති රජු ලෙස තමන් වහන්සේ රජ කළ බැව් වදරා, මහා සුදස්සන ජාතකය දේශනා කළ සේක. අවසානයේ බුදු දහමේ ගැටලු සහගත තැන් විමසා, අවසන චතුර්ථ ධ්‍යානයට සම වැදී පිරිනිවන් පා වදාළහ.

මහා සුදස්සන ජාතකය (මහා සුදර්ශන සූත්‍රය) බුදුරජාණන් වහන්සේ දෙසූ අවසන් සූත්‍රයයි. වෙසක් දින, පරිනිර්වාණ මංචකයේ දී මෙම ජාතකය වදාළ සේක.

එනම්, ඈත අතීතයේ කුසිනාරා පුරයේ මහා සුදර්ශන සක්විති රජු රාජ්‍ය කරන කල, එය සැම දෙයින් ම සපිරි රාජධානියක් විය. කුසිනාරා නුවර වටා ඇති දොළොස් යොදුන් පවුරේ පවා මුතු මැණික් ඔබ්බවා තිබුණි. එකල සුදර්ශන සක්විති රජුට 'ධර්ම' නම් මාළිගාවක් විය. සංසාර ගමනේ දී ලැබෙන සැප සම්පත් අනිත්‍ය බව පසක් කළ රජ මාළිගාවෙන් පිටවිය. එහි ඉදිරිපිට ඇති සල් උයනේ පැනැවූ ආසනයක , නැවත සැපවත් ජීවිතයක් සොයා

මාළිගාවට නොඑමියි පවසා සැතපුණි. මේ තමාගේ මරණ මංචකය බැව් අග බිසව සුභද්‍රා හා එක ම පුතුහට පැවසී ය. එවිට සුභද්‍රා බිසව ''ස්වාමීනි, මෙපමණ සැපසම්පත් ඇති සුවාසූ දහසක් පිරිවර ඇති මේ කුසිනාරා පුරයට ඇලුම් කරනු මැනවි. අත් නොහරිනු මැන'' යයි පවසා සිටියාය. එවිට රජතුමා,

''දේවිය, අදම මිය යන්නෙමි. මේ සැප සම්පත්වලට ඇලුම් නොකරන්න, අපේක්‍ෂා නොකරන්න. සියල්ල තාවකාලික ය. මේ බව රට වැසියනට දැනුම් දෙන්නැයි පැවසී ය.

රජුගේ වදන් ඇසූ සැවොම හඬන්නට පටන් ගත්හ. ඔවුන් කැඳවූ රජතුමා මේ ලොව සදා පවතින දෙයක් නොමැති බවත් සියල්ල අනිත්‍ය බවත් අවබෝධ කරගන්නැයි පැවසී ය. අවසානයේ මිය පරලොව ගිය මහා සුදර්ශන සක්විති රජතුමා දෙව්ලොව උපන.

මෙම අතීත කථාව වදාළ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සුභද්‍රා බිසව, දැන් යසෝදරා දේවිය බවත්, එකම පුතු රාහුල ස්ථවිරයන් බවත් සුදර්ශන සක්විති රජ තමන් වහන්සේ බවත් පැවසූ සේක.

බුදුරජාණන් වහන්සේ තම ජීවිතයේ අවසාන හෝරාවෙහි දේශනා කරන ලද මහා සුදස්සන ජාතකය, අපහට ලොව සැම දෙයක් ම අනිත්‍ය බව පසක් කරවයි. මැදුම් පිළිවෙත අනුගමනය කිරීමෙන් ජීවිතය මෙලොව දී මෙන් ම පරලොව දීත් ජය ගත හැකි බව කියා දේ.



# වොරැඳේ වා මගෙ පින් බිම

**පුෂ්පා ජයවර්ධන මහත්මිය විසිනි**

සමන් ගිරි හිස සිඹිමින්
හමන මඳනල සමගින්
පාව එන මල් සුවඳින්
මගේ සිරිලක දිලේ නිබඳින්

කොත් කැරලි අග කිරණින්
අතුරවා රන් නෙළුමින්
පුදන දෙව් බඹ පහසින්
මගේ පින් බිම දිලේ නිබඳින්

සතර දළඳ සමිඳු සරණින්
අසිරිමත් බෝ සමිඳු පිහිටෙන්
උතුම් තෙරුවන් බලේ මහිමෙන්
මගේ පින් බිම වොරඳ නිබඳින්

සිංහල ජාතිය අභිවෘද්ධියට පමුණුවාගැනීමට ගිහි පැවිදි දෙ කොටස ම සමඟියෙන් සමාදානයෙන් ඒකීය භාවයෙන් ක්‍රියා කට යුතු යි. ශාස්ත්‍රශාලා ශිල්පශාලා විවෘත කොට සිංහල බාලක බාලිකාවන්ට බාල කාලයේ සිට ශිල්ප කර්මාන්ත උද්ග්‍රහණය කට යුතු යි. ජර්මනිය, ඇමෙරිකාව, දඹදිව, ජපානය, එංගලන්තය, ප්‍රංසය, ඉතාලිය යන රටවලට සිංහල තරුණයන් යවා ශාස්ත්‍ර ශිල්ප ඉගැන්වීමට මාර්ග තැනිය යුතු යි. විපර්යාස ගති අලසකම් අත්හැර ගිහි පැවිදි දෙ කොටස ම සමඟියෙන් ක්‍රියා කිරීමට උත්සාහ කට යුතු යි. ධනවත් සිංහල තරුණ මහතුන් විසින් ස්වකීය ධනය අනර්ථයේ වියදම් නොකොට ආර්ය සිංහල ජාතිය දියුණු කිරීමට වියදම් කට යුතු යි. දිවා රාත්‍රි දෙක්හි ම සිංහලයන් වීර්ය කළොත් පස්වර්ෂයක් තුළ දී සිංහල ජාතිය දියුණු අඩියකට පමුණුවාගත හැකි ය. සිංහලයනි ! සිංහ වීර්යයෙන් ක්‍රියා කරනු.

**ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා**

("දැනගත යුතු කරුණු" නම් කෘතියෙන් උපුටා ගන්නා ලදි)



# MAHA KASSAPA THERA - DHAMMAPADA V.61

Compiled by: **Mrs. Srima warusawithana.**

Maha Kassapa – a foremost disciple of the Buddha
Revered, venerated by all – as a disciplined virtuous monk,
Had two bhikkhus in close association with the MahaThera
Living in the serene and beautiful cave - Pulilalena in the vicinity of Rajagaha.
One of them – heedful and diligent in his own welfare,
Whilst progressing well in the path of the Dhamma –
Dutifully attended on the Maha thera too.
The other monk – full of guile, deceitful, indolent,
Spent his time in idle manner, eating, sleeping in the most disgusting way,
Yet presenting a different picture – pretending as if he was the one
Attending to the needs of the Maha Thera. Such conduct loathsome,
Maha Thera Kassapa advised the young bhikkhu how deceit is very wrong,
And how noble it is to dwell in conduct worthy of a Buddha's disciple.
It was of no avail….Then, one day the slothful, deceitful one,
Went to a house of a lay devotee, got food pretending it was for the Maha Thera,
Came back and devoured the food himself …Kassapa Maha thera when informed
Of this, admonished the offender once again. With hateful thoughts
He vowed to take revenge upon his teacher. And when the Maha Thera
Was on his almsround accompanied by the disciplined, gentle bhikkhu,
He smashed the bowls and vessels for food and water in the cave monastery,
Set fire to the place and ran away.
From the monks returning to Savatthi where the Buddha dwelt,
Inquired the Master – news from Rajagaha…they gave true account
Of what the slothful monk had done – The Buddha uttered these words,
Full of meaning, full of good advice :
"A person in search of a virtuous friend , must indeed find one
Who is higher or equal in virtue, and failing to find such a one,
It is better to live joyfully alone with utmost determination.
There should not be company with fools."